SLS Bank

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
இலங்கை சேமிப்பு வங்கி
Sri Lanka Savings Bank

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ**
**(NSB) පූර්ණ පරිපාලිත**
**බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි**

අපගේ සංස්කෘතිය තරගකාරී මායිම් කරා ළඟාවීම සඳහා සමාජීය වගකීම්, නව්‍ය අදහස් හා පත්තරය යන ගති ලක්ෂණ වලින් සමන්විතව ඇත. අපගේ පෙර නොවූ අයුරු විශ්වාසවන්ත භාවයේ හා සේවයේ වූ කාර්ය සාධනය හේතුවෙන් අපගේ පැතිරී ගිය වැඩි වර්ධනය වෙමින් හා වඩා කුළුපග වූ ගනුදෙනුකාර ජාලයක් තුළින් අප අතිශය දියුණු අදියරයක් කරා ළඟාවෙමින් සිටින්නෙමු. දීප ව්‍යාප්තව අපගේ කටයුතු ශාඛා ජාලය තුළින් වැඩි වර්ධනය වෙමින් පවත්නා හෙයින් බැංකුවේ දර්ශනය කරා ළඟාවීම සඳහා නායකත්වය දෙමින්, සැලසුම් සකසමින්, උපායමාර්ග හඳුන්වා දෙමින් / ක්‍රියාත්මක කරමින් හා අධීක්ෂණය කරමින් මෙන්ම මෙම බැංකුවේ සේවයේ සහභාගීත්වයම අභිමානයක් කොට ගත හැකි සාර්ථකත්වයේ දිශානතියෙහි ගිඳිමින් කටයුතු කළ හැකි ක්‍රියාශීලී පුද්ගලයින් අවශ්‍යව ඇත. මෙය ඔබගේ සිහිනය කරා සැබවින්ම ළඟාවිය හැකි අවස්ථාවක් වනු ඇත.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මූල්‍ය හා සැලසුම්

**වෘත්තීය පැතිකඩ**

- මූල්‍ය අංශ ප්‍රධානියා වශයෙන් එම දෙපාර්තමේන්තුවට අවශ්‍ය නායකත්වය සහ මගපෙන්වීම ලබාදීම.
- ගිණුම් කටයුතු, මූල්‍ය පුරෝකථනය, අයවැය සහ මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ සුපරීක්ෂණය.
- ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලතාව දැක්වීම සහතික කිරීම.
- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ කිරීම.
- සාමාතධිකාරී ඇතුළු කළමනාකාරිත්වයට අවශ්‍ය උපායමාර්ගික නිර්දේශයන් ලබාදීමට කටයුතු කිරීම.
- වත්කම් සහ වගකීම් කළමනාකරණය.
- ශ්‍රී ලංකා / ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලතාව දැක්වීම සහතික කිරීම.

**සුදුසුකම්**

- පිළිගත් ආයතනයක (ICASL, ACCA හෝ CIMA) සාමාජිකත්වය සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධිය (MBA) සමග වසර 08ක පශ්චාත් සේවා පළපුරුද්ද. මින් වසර 05ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ තනතුරක විය යුතු අතර, අවම වසර 02ක විගණන ආයතනයක පළපුරුද්ද තිබිය යුතුය.

හෝ

- පිළිගත් ආයතනයක (ICASL, ACCA හෝ CIMA) සාමාජිකත්වය සමග වසර 10ක පශ්චාත් සේවා පළපුරුද්ද. මින් වසර 05ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ තනතුරක විය යුතු අතර, අවම වසර 02ක විගණන ආයතනයක පළපුරුද්ද තිබිය යුතුය.

## නිලධාරී-නීති (කොන්ත්‍රාත් පදනම)

**වෘත්තීය පැතිකඩ**

- බැංකුව වෙනුවෙන් අධිකරණයන්හි පෙනී සිටීම සහ ඒ සම්බන්ධ ඉදිරි කටයුතු පවත්වාගෙන යාම.
- අධිකරණයට යෝග්‍ය පරිදි උත්තරවාද සැකසීම සහ නොතිසි / එන්තරවාසි සැකසීම.
- සියලුම ව්‍යවස්ථාපිත නීති අවශ්‍යතාවයන්ට අනුකූලතාව දක්වමින් බැංකුවේ නීති ලියකියවිලි සකස් කිරීම.
- බැංකුවේ ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ නීතිමය උපදෙස් කළමනාකාරිත්වය වෙත ලබාදීම.

**සුදුසුකම්**

- උසාවි කටයුතු, නීති ලේඛන කෙටුම්පත් කිරීම පිළිබඳ නීතිඥයකු සහ ප්‍රසිද්ධ නොතාරිස් වරයකු ලෙස වසර 03ක පශ්චාත් සේවා පළපුරුද්ද.
- කණ්ඩායම් හැඟීමෙන් සහ විශිෂ්ඨ අන්‍යොන්‍ය සම්බන්ධතාවයන්ගෙන් යුක්ත වීම.
- පරිගණක දැනුම සහ සිංහල සහ ඉංග්‍රීසි භාෂා චතුරත්වය (ලිවීම සහ කථනය).
- බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක සේවා පළපුරුද්ද ඇති අයවලුන් හට ප්‍රමුඛත්වය ලබාදීම.
- දමිල භාෂාව පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

## නිලධාරී - තොරතුරු ආරක්ෂණ

**වෘත්තීය පැතිකඩ**

- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන් සහ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සහ යාවත්කාලීන කිරීම මගින් බැංකුවේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ කාර්යය සඳහා දායකත්වය ලබාදීම.
- Firewall හි මෘදුකාංග පිරිවිතරයන්ගේ පරිමාණයෙන් සතිපතා ස්වාධීනව විශ්ලේෂණය කිරීම හා නව්‍යකරණයන් සමග අනුබද්ධ වූ අවධානම් ඉස්මතු කිරීම.
- අවධානම් පද්ධති සඳහා වූ පිවිසුම් හා විශේෂිත වරප්‍රසාද භාවිතාවන් කාලානුරූපීව විශ්ලේෂණය කිරීම සහ යෝග්‍ය පාලනයන් ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු ආරක්ෂණ දැනුවත් කිරීම්, පුහුණු සහ අධ්‍යයන ක්‍රියාකාරකම් පැවැත්වීම.
- අවිනිශ්චිත අවස්ථා සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ කටයුතු සහ තොරතුරු තාක්ෂණ ආපදාවයන් යථා තත්ත්වයට පත් කිරීමේ කටයුතුවලට අදාළ ක්‍රියාකාරකම් සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

**සුදුසුකම්**

- තොරතුරු ආරක්ෂණය / තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය හෝ ඒ හා සමාන වෙනත් වෘත්තීය සුදුසුකම් සමග තොරතුරු ආරක්ෂණ, තොරතුරු තාක්ෂණ හෝ තොරතුරු පද්ධති විගණනය පිළිබඳ වසර 03ක පශ්චාත් සේවා පළපුරුද්ද. බැංකුවක හෝ මූල්‍ය ආයතනයක සේවා පළපුරුද්ද වඩාත් යෝග්‍ය වේ.
- තොරතුරු තාක්ෂණ සහ තොරතුරු ආරක්ෂණ මූලධර්ම පිළිබඳ ඉහළ දැනුවත්කම.
- Firewall මෘදුකාංග පිළිබඳ පූර්ව පළපුරුද්ද.

## ණය නිලධාරී

**වෘත්තීය පැතිකඩ**

- ණය ඉලක්ක කරා ළඟාවීම / නව ගනුදෙනුකරුවන් අත්පත් කරගැනීම.
- මූල්‍ය, මෙහෙයුම් සහ අවධානම් විශ්ලේෂණය සහිතව ණය ඇගයීම් සිදුකිරීම.
- ගනුදෙනුකරුවන් විසින්ත කිරීම සහ සුපරීක්ෂණය.
- එක් එක් ණය සම්බන්ධයෙන් වූ අවධානම හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ එම අවධානම අවම කිරීම සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීම.
- ණය සුරැකුම් ලියවිලි සම්පාදනය සහ පසු විපරම් කිරීම.
- ලබාදුන් ණය පහසුකම් ක්‍රමිකව පවත්වා ගැනීම.
- විධිමත් ලෙස ණය ආපසු ගෙවීම අධීක්ෂණය.

**සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය හෝ ඒ හා සමාන වෙනත් වෘත්තීය සුදුසුකම් සමග ණය ඇගයීම පිළිබඳ බැංකුවක හෝ මූල්‍ය ආයතනයක වසර 03ක පශ්චාත් සේවා පළපුරුද්ද.

හෝ

- AIB / බැංකු කළමනාකරණ ඩිප්ලෝමාව සමග බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ණය නිලධාරියකු / විධායකයකු ලෙස වසර 05ක විස්තිරණ සේවා පළපුරුද.

හෝ

- අ.පො.ස (සා/පෙළ) ගණිතය, ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ ඇතුළුව සම්මාන සාමාර්ථ 05ක් සහ අ.පො.ස (උ/පෙළ) සම්මාන සාමාර්ථ 03ක් සහිතව සමත් වීම සමග බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ණය නිලධාරියකු / විධායකයකු ලෙස වසර 07ක විස්තිරණ සේවා පළපුරුද්ද.
- ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත් වී තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

ඔබ ඉහත සුදුසුකම් සපුරන්නේ නම්, **www.slsbank.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ careers@slsbl.lk, යන විද්‍යුත් ලිපිනයට ඉල්ලීමක් කිරීම මගින් අදාළ අයදුම්පත ලබාගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.01.04 වන දින හෝ ඊට පෙර **careers@slsbl.lk** යන විද්‍යුත් ලිපිනයට හෝ පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම් කරනු ලබන තනතුර විද්‍යුත් පණිවිඩයේ විෂය කොටසේ හෝ ලියුම් කවරයේ වම්පස ඉහළ කොටසේ සඳහන් කිරීම අනිවාර්ය වේ. නිර්දේශිත ආකෘතියට අනුව ලැබෙන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

**මේ සම්බන්ධයෙන් යම් අයුරකින් හෝ බලපෑම් සිදුකිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත අයදුම් කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය බැංකුව වෙත පවතී.**

**ප්‍රධාන කළමනාකරු - මානව සම්පත් සංවර්ධන,**
**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව,**
**නො.265, වෝඩ් පෙදෙස, කොළඹ 07.**

**www.slsbank.lk** **careers@slsbl.lk**

Source: Silumina, Sunday Observer (2020.12.20)